සජිත් ප්‍රේමදාස, (පා.ම.)
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
Sajith Premadasa, (M.P.)
Leader of the Opposition - Parliament of Sri Lanka
சஜித் பிரேமதாச, (பா.உ.)
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்

2023.06.14

**<u>මැදමුලනින් නැවත හිස ඔසවන ගෝත්‍රික මිලේච්ඡත්වය පරාජය කරමු!</u>**

කිසියම් මිලේච්ඡ කල්ලියක් විසින් සමගි ජනබලවේගයේ වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මැදමුලන කොට්ටාශයේ පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයාව කටයුතු කළ චින්තක සම්පත් මහතාගේ වාහනයට ගිනිතබා තමන්ට හුරු පුරුදු දේශපාලන ප්‍රචණ්ඩත්වයට හිස එසවීමට කටයුතු සිද්ධ කොට තිබේ.

මේ පිළිබඳව විනිවිද පෙනෙන අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට එරෙහිව ගත හැකි සියලු නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවට අපි අවධාරණය කරමු.

චින්තක සම්පත් මහතා ප්‍රදේශයේ කැපී පෙනෙන තරුණ දේශපාලනඥයෙකු ලෙස පෙරට එමින් සිටි අතර ඔහුගේ සමාජ සේවා කටයුතු කෙරෙහි ප්‍රසාදයට පත්ව ප්‍රදේශයේ ජනතාව දිනෙන් දින ඔහු සහ සමගි ජන බලවේගය වටා පෙළගැසෙමින් සිටින අතරතුර,එය දරාගත නොහැකි බියගුලු මිලේච්ඡ කල්ලියක් විසින් මෙම ගිනි තැබීම සිදු කොට ඇති බව අප විශ්වාස කරමු.

අන්තනෝමතික අදූරදර්ශී පාලන ක්‍රමය හේතුකොටගෙන රට බංකොලොත් තත්වයට පත්කළ පොහොට්ටු ආණ්ඩුවට එහි ප්‍රතිඵලයක් ලෙස ජනතා අරගලය හමුවේ ජනාධිපති අගමැති සහ මැති ඇමැති තනතුරු අතහැර යන්නට සිදුවිය.

අද ඔවුන් ජනාධිපතිවරයාගේ ද ආශිර්වාදය ඇතිව අලුත් වටයකින් ආරම්භ කොට ඇත්තේ හිංසනය ප්‍රචණ්ඩත්වය සහ මිලේච්ඡත්වය පදනම් කරගත් අශිෂ්ට පන්නයේ නැගී සිටීමකි.

මේ දුර්දාන්ත තත්ත්වයට එරෙහිව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට සමගි ජන බලවේගය පසුබට නොවන අතර ඔවුන්ට හුරු පුරුදු ප්‍රචණ්ඩ ගෝත්‍රික දේශපාලනයට එරෙහිව එකාවන්ව පෙළ ගැසෙන බව ද අවධාරණය කරමු.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாகஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephons: 011 2777253, 0112699171
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: sajith_p@dialo.net